සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

(පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus)

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

2019.08.07 / 0830 - 1030

| | | |
|---|---|---|
| පෙරදිග සංගීතය I<br>கீழைத்தேய சங்கீதம் I<br>Oriental Music I | 54 S I | පැය දෙකයි<br>இரண்டு மணித்தியாலம்<br>Two hours |

විභාග අංකය : ..........................

**පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා**

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 01 | 1 - 5 | |
| 02 | 6 - 14 | |
| 03 | 15 - 24 | |
| 04 | 25 - 34 | |
| 05 | 35 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

**උපදෙස්:**
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සැපයිය යුතු ය.

- අංක **1** සිට **25** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේදී නිවැරදි හෝ ඉතා ම ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ** ලියන්න.

**1.** මධ්‍යමය වාදී ස්වරය ලෙසත්, සඩ්ජය සංවාදී ස්වරය ලෙසත් යෙදෙන රාග යුගලය තෝරන්න.
(1) බහාර් - බිහාග්
(2) තිලක්කාමොද් - මාල්කෞන්ස්
(3) බ්‍රින්දාබනී සාරංග - භීම්පලාසි
(4) බාගේශ්‍රී - ආසාවරී
(5) බාගේශ්‍රී - බහාර් (......)

**2.** 'පරමේල ප්‍රවේශක' රාග යටතට ගැනෙනුයේ,
(1) දේස් රාගයයි.
(2) බිහාග් රාගයයි.
(3) ජයජයවන්ති රාගයයි.
(4) බාගේශ්‍රී රාගයයි.
(5) ජෞනපුරි රාගයයි. (......)

**3.** 'අලංකාරික තාන' නිර්මාණයේ දී වඩාත් ප්‍රයෝජනවත් වනුයේ,
(1) රාග සංගතීන් ය.
(2) රාග විස්තර ය.
(3) රාගාශ්‍රිත පල්ටා ය.
(4) රාග මුඛ්‍යාංග ය.
(5) රාග ආරෝහණ - අවරෝහණ ය. (......)

**4.** සමප්‍රකෘති රාග යුගලයක් ඇතුළත් වරණය තෝරන්න.
(1) දේස් - බිහාග්
(2) බිහාග් - බාගේශ්‍රී
(3) බාගේශ්‍රී - තිලක්කාමෝද්
(4) තිලක්කාමෝද් - කාලිංගඩා
(5) කාලිංගඩා - භෛරව (......)

**5.** රාග ආලාප ගායනය/වාදනය සඳහා වඩාත් ම ප්‍රයෝජනවත් වනුයේ,
(1) රාග සංගතීන් ය.
(2) රාග පල්ටා ය.
(3) රාග ලක්ෂණ ය.
(4) රාග ගීතය ය.
(5) රාග ගානසමය ය. (......)

[ දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

- අංක **6** සිට **8** තෙක් ප්‍රශ්න සඳහා (තානාලංකාර සහිත වාදිතයකට අයත්) පහත ස්වර ප්‍රස්තාරය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| $^{\text{නි}}$ධ | - | - | ධ | නි | ධ | ස̇ | රි̇ | ස̇ | නි | ධ | ප | - | (ප) | ග | ම |
| ධ | - | - | ධ | නි | ධ | ස̇ | රි̇ | ස- | ගම | ධනි | ස̇රි̇ | ස̇නි | ධප | ම්ප | ගම |
| x | | | | 2 | | | | 0 | | | | 3 | | | |

**6.** ඉහත ස්වර ප්‍රස්තාරයෙන් පිළිබිඹු වන රාගය කුමක් ද?
(1) බිහාග් (2) හමීර් (3) දේස්
(4) ජයජයවන්ති (5) බහාර් (……)

**7.** ස්වර ප්‍රස්තාරයෙහි සඳහන් තානාලංකාර වර්ගය කුමක් ද?
(1) අලංකාරික තාන (2) බෝල් තාන (3) සපට් තාන
(4) මිශ්‍ර තාන (5) කූට තාන (……)

**8.** ඉහත ස්වර ප්‍රස්තාරයෙහි සඳහන් කන් ස්වරය සහ මූර්ඡා ස්වරය පිළිවෙළින්
(1) ධ සහ ප වේ. (2) නි සහ ම වේ. (3) ප සහ නි වේ.
(4) නි සහ ප වේ. (5) ම සහ ප වේ. (……)

**9.** ගම රිස ගම ධ,ග | මරි සග මධ, ගම | රිස ගම ධ- ගම | රිස ගම ධ,ග මරි |
සග මධ, ගම රිස | ගම ධ- ගම රිස | ගම ධ,ග මරි සග | මධ, ගම රිස ගම | ධ
X 2 0 3 X

ඉහත තානාලංකාර කොටසින් පිළිබිඹු වන්නේ,
(1) මුඛඩාවක් ය. (2) තිහායි එකක් ය.
(3) ගමක් ය. (4) උපජ් ය.
(5) චක්‍රධාර් එකක් ය. (……)

**10.** තබ්ලාවෙන් වැයෙන ධ, ධිං, තිං, ත යන අවනද්ධාක්ෂර සියල්ලම යොදා ගැනෙන නිර්දේශිත තාල දෙකක් වන්නේ,
(1) ත්‍රිතාල් සහ දාදරා ය. (2) දාදරා සහ දීප්චන්දි ය.
(3) දීප්චන්දි සහ ත්‍රිතාල් ය. (4) ත්‍රිතාල් සහ ජප්තාල් ය.
(5) ජප්තාල් සහ දාදරා ය. (……)

**11.** විභාගවල මාත්‍රා සංඛ්‍යාවන් එකිනෙකට වෙනස්ව යෙදෙන, විභාග හතරකින් යුත් තාලය තෝරන්න.
(1) ජප් තාලය (2) දීප්චන්දි තාලය (3) තිලවඩා තාලය
(4) ත්‍රිතාලය (5) ධමාර් තාලය (……)

**12.** | ධ - | නි ස̇ | රි̇ ස̇ | නි̱ ප | මප ගම | රිස ගම |
x 0 2 0 3 4

ඉහත ස්වර ප්‍රස්තාරයෙන් පිළිබිඹු වන ගත් වාදිතයෙහි රාගය සහ තාලය පිළිවෙළින්,
(1) බහාර් සහ චෞතාල් ය. (2) හමීර් සහ චෞතාල් ය.
(3) හමීර් සහ ඒක්තාල් ය. (4) බහාර් සහ ඒක්තාල් ය.
(5) ජයජයවන්ති සහ ඒක්තාල් ය. (……)

**13.** සංගීතය යනු "ගීතං වාද්‍යං තථා නෘත්‍යං ත්‍රයං සංගීතමුච්‍යතේ" ලෙස නිර්වචනය කරනු ලැබුවේ,
(1) සංගීත රත්නාකර කෘතියෙහි ය. (2) සංගීත පරිජාත කෘතියෙහි ය.
(3) බෘහත්දේශී කෘතියෙහි ය. (4) නාට්‍ය ශාස්ත්‍ර කෘතියෙහි ය.
(5) ක්‍රමික් පුස්තක් මාලිකා කෘතියෙහි ය. (……)

**14.** තත්වාද්‍ය භාණ්ඩ තුනකට අයත් ලක්ෂණ පහත දැක්වේ.
A - පර්දා සහිත ය - අළුවෙන් වැයේ
B - පර්දා රහිත ය - අළුවෙන් වැයේ
C - පර්දා සහිත ය - අළුවෙන් නොවැයේ
A, B, C සඳහා ගැළපෙන සංගීත භාණ්ඩ පිළිවෙළින් සඳහන් වරණය කුමක් ද?
(1) සිතාර්, සාරංගි, එස්රාජ් (2) සිතාර්, වයලින්, එස්රාජ්
(3) එස්රාජ්, වයලින්, සරෝද් (4) එස්රාජ්, සාරංගි, සරෝද්
(5) එස්රාජ්, වයලින්, සිතාර් (……)

[තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

4523

- පහත කරුණු ඇසුරින් **15** සහ **16** යන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

  A - මෘදංගම්
  B - පඛාවාජ්
  C - පල්ලවි - අනුපල්ලවි
  D - ස්ථායි - අන්තරා
  E - ආදි තාලම්
  F - චෞතාල්

**15.** කර්ණාටක සංගීත පද්ධතියට අයත් කරුණු ඇතුළත් වන්නේ කුමන අක්ෂර යටතේ ද?
(1) A, B හා C (2) A, C හා E (3) B, C හා D
(4) B, D හා F (5) C, D හා E (......)

**16.** B සහ F යන අක්ෂර යටතේ සඳහන් කරුණු හා සම්බන්ධ ගායන ශෛලිය කුමක් ද?
(1) ධමාර් (2) ඛ්‍යාල් (3) ධ්‍රැපද් (4) චතුරංග (5) වර්ණම් (......)

**17.** | $\hat{1}$ 2 3 | $1'$ 2 3 4 | $\hat{1}$ 2 3 | $1'$ 2 3 4 | යන තාල රූපයට වාදනය කළ හැකි උඩරට බෙර පදය කුමක් ද?
(1) | ජි ං ත | කු කු ද ත | ජි ග ත | ග ති ග ත |
(2) | ගු ම් s | ගු ම් ද ත් | ග ත් ත | ග ත ගු ද |
(3) | දො ං දො | ජි ං ග ත | ජි ග ත | දො ං ත ක |
(4) | ත කු ම | ත රි කි ට | දි කු ම | ත රි කි ට |
(5) | ත ත් ත | ජි ත් ත ත් | ත ං ක | දො ං ක ඩ | (......)

**18.** පහත දැක්වෙන ගී පාද අතුරෙන්, ගැමි සමාජයේ 'සාමූහික බව' දනවන අවස්ථා විදහා දැක්වෙන ගී පාද තෝරන්න.
A - තෙල් ගාලා හිස පීරන් නැනෝ
B - වෙල් යායක ගොන් දෙන්නෙක් කකා උනි
C - වරම් ගොයම් කැපුමට දෙවියන්ගෙ වරම්
D - අම්මපල්ලා බඹරුන් අත වරද නැති
E - සූරිය උදාවන තුරු පිනි බැව්ල්ල
(1) A සහ C (2) A සහ E (3) B සහ C
(4) B සහ D (5) D සහ E (......)

**19.** හින්දුස්ථානි රාගධාරී සංගීතයේ එන ජෞනපුරි සහ භෛරවි යන රාග පදනම්ව නිර්මාණය වූ නුර්ති ගීත දෙකක් වන්නේ පිළිවෙළින්,
(1) 'ලෝනා මුණි රාජාගේ' සහ 'අප ගුණසරු සිංහල' යන ගීතයි.
(2) 'සිරි සංඝබෝධි' සහ 'සෝබමාන දේ වපුරා' යන ගීතයි.
(3) 'මිහිරි නාද කෝකිලාදි' සහ 'සවන්දී පෙර රාම' යන ගීතයි.
(4) 'පායන මේ බැද්දෙ' සහ 'බන්දා මා දේදො' යන ගීතයි.
(5) 'දන්න වංහුං අප' සහ 'දන්නෝ බුදුන්ගේ' යන ගීතයි. (......)

**20.** ජන ජීවිතයේ සිදුවීම් ඇතුළත්, ආවේණික භාෂාවෙන් හා ඒකාකාරී නාදමාලාවන්ගෙන් සමන්විත වූ පැරණිතම ගීත විශේෂය කුමක් ද?
(1) ටීකා සීපද (2) සැහැලි (3) සව්දම් (4) වැදි ගීත (5) යාදිනි (......)

**21.** 'ගීතයක්' මධ්‍යයේ හෝ අග හෝ තනුවකට අනුව තාලානුකූලව බෙරපද ගායනා කරන ගීත විශේෂය කුමක් ද?
(1) හටන් (2) මංගලම් (3) අස්නෙ (4) වන්නම් (5) ප්‍රශස්ති (......)

**22.** දීර්ඝ යති යෙදෙන අඩු ලයකින් යුතුව, කාන්තාවන් විසින් ගයනු ලබන මෙහෙ ගී විශේෂය කුමක් ද?
(1) වරම් ගී (2) ගොයම් ගී (3) නෙළුම් ගී (4) කමත් ගී (5) දැල් ගී (......)


**23.** තුන්සුළු දෙමහ පස්තිතට අනුව ගැයෙන උඩරට නර්තන අංගයක් වන්නේ,
(1) අස්නෙ ය. (2) මංගලම් ය.
(3) කොහොඹා හැල්ල ය (4) වට්ටම් ය.
(5) වන්නම් ය. (......)

**24.** "බාල මෙ මගෙ වැරදි නොගන් - මෙම රාළහාමිලා මට ආයුබොවන්" යන ගීතය ගයනු ලබන කෝලම් චරිතය කුමක් ද?
(1) සඳ කිඳුරිය (2) ජසයා (3) නොංචි අක්කා
(4) ලෙන්චිනා (5) මුදලි (......)



Department of Examinations Sri Lanka

**25.**




ඉහත ස්වර පුවරු රූපසටහනේ ලකුණු කර ඇති ස්වර **ත්‍රිත්වය** එක්වර වැයෙන විට නිකුත් වන අපරදිග ස්වර සංචය (CHORD) නම් කරනුයේ,

(1) C major යනුවෙනි.
(2) C minor යනුවෙනි.
(3) D major යනුවෙනි.
(4) D minor යනුවෙනි.
(5) C diminished යනුවෙනි.

(.......)

- අංක **26** සිට **30** තෙක් ප්‍රශ්නවල ඇති හිස්තැන් සඳහා සුදුසු ම පිළිතුරු යොදන්න.

**26.** සමූහ වාදන සහ සමූහ ගායන යන අංග දෙකම යොදා ගනු ලබන බටහිර සංගීතාංගය නම් කරන්නේ කෙසේ ද?

........................................

**27.** 'සූත්‍රධාරී' යන චරිතය ඇතුළත් රංග ශෛලිය නම් කරන්න.

........................................

**28.** ගී පද, සර්ගම්, තිර්වට්, තරාණා අංග සියල්ල ඇතුළත් ගායන ශෛලිය කුමක් ද?

........................................

**29.** 'සැක්සෆෝනය' සිංගල් රීඩ් (Single reed) වර්ගයට අයත් වේ. එසේම, 'බැසූන්' සහ 'ඕබෝ' යන සුෂිර වාද්‍ය භාණ්ඩ අයත් වන වර්ගය නම් කරන්න.

........................................

**30.** ෆ්ලැට් ස්වර හෝ ෂාප් ස්වර කිසිවක් **නොයෙදෙන** මයිනර් ස්කේලය කුමක් ද?

........................................

- අංක **31** සිට **34** තෙක් ප්‍රශ්න සඳහා පහත ඡේදය කියවා පිළිතුරු සපයන්න.

සංගීත ප්‍රසංගයක දී නිපුනි විසින් අළුවෙන් (Bow) වැයෙන, පර්දා නොමැති සිය සංගීත භාණ්ඩයේ අනුතත් සුසර කර ගනිමින්, අ. පො. ස. (උසස් පෙළ) සඳහා නිර්දේශිත රාගයකින් ඉදිරිපත් කරන ලද වාදිතයේ, අන්තරා කොටස, | මපනි | ස̇-ස̇ස̇ | රි̇ රි̇ගු̇ රි̇ | ස̇ - නිධ | ලෙස, එක් තතක් මත ඇඟිලිවල නියපොතු ඝර්ෂණය කරමින් වැයී ය.

**31.** නිපුනි විසින් වැයූ රාගය අයත් මේලය .................. නමින් හැඳින්වෙන අතර, එම රාගයේ ජාතිය ..................... වේ.

**32.** ඉහත වාදිතයේ කෝමල ගාන්ධාරය විවාදි වූයේ නම්, ඇය වැයුවේ ........................... රාගය වන අතර කෝමල ගාන්ධාරය ආංගිකව යෙදුවේ නම්, ඇය වැයුවේ ............................ රාගයයි.

**33.** 'නිපුනි' වැයූ භාණ්ඩය ......................... නමින් හැඳින්වෙන අතර ඉහත ඡේදයෙහි විස්තරය අනුව අළුව වෙනුවට වෙනත් උපකරණයක් යොදා ගත්තේ නම් ඇය වැයූ භාණ්ඩය ......................... ලෙස නම් කළ හැකි ය.

**34.** එම වාදිතය සඳහා වැයූ තාලය ......................... නමින් හැඳින්වෙන අතර, එම තාලය වැයූ වාද්‍ය භාණ්ඩය ......................... නමින් හැඳින් වේ.



Department of Examinations Sri Lanka

● අංක **35** සිට **50** තෙක් ප්‍රශ්නවල ඇති හිස්තැන් සඳහා සුදුසු ම පිළිතුරු යොදන්න.

**35.** 'පන්කජ් උදාස්' නම් භාරතීය ගායන ශිල්පියා ...................... ගායන ශෛලියට සුප්‍රසිද්ධ වේ. 'පායෝජී මෛනේ රාම රතන' ගීතය ...................... ගායන ශෛලියට අයත් ය.

**36.** උස්තාද් බිස්මිල්ලා ඛාන් ...................... නමැති සංගීත භාණ්ඩය වාදනය සඳහා සුප්‍රසිද්ධ වන අතර, පණ්ඩිත් ශිවකුමාර් ශර්මා ...................... නමැති සංගීත භාණ්ඩය වාදනය සඳහා සුප්‍රසිද්ධ වේ.

**37.** 'හෙළ ගී මග' කෘතිය .................................... මහතා විසින් ද, ක්‍රමික් පුස්තක් මාලිකා කෘති පෙළ .................................. විසින් ද රචනා කරන ලදී.

**38.** 'සත් සමුදුර' චිත්‍රපටයේ සංගීත අධ්‍යක්ෂණය .......... .................... සූරීන්ගේ වන අතර එහි තේමා ගීතය ගායනා කරන ලද්දේ ............................... සූරීන් විසිනි.

**39.** ග ස රි ම, ම රි ග ප, වශයෙන් ආරෝහණයට පිළිවෙළින් යෙදෙන ස්වර අභ්‍යාස රටාවේ ඊළඟ පියවරට අයත් ස්වර හතර ........... වන අතර, එහි අවරෝහණ රූපයට අනුව යෙදෙන ප්‍රථම පියවරෙහි ස්වර හතර ........... වේ.

**40.** පහත දැක්වෙන එක් එක් ස්වර ඛණ්ඩය ඉදිරියෙන් එය අයත් වන නිර්දේශිත රාගය නම් කරන්න.

(a) ස නි̣ ධ̣ නි̣ ස ම, ............................

(b) ස නි̣ ධ̣ නි̣ ස ම, ............................

**41.** ධාධාතිට | ධාධාතුනා | තාතාතිට | ධාධාතුනා | වශයෙන් වැයෙන කායදාව අයත් වන තාලය............... නමින් හැඳින්වෙන අතර ධාධාතිට ධාධාතුනා | ධා +, වශයෙන් වූ අවනද්ධාක්ෂර තෙවරක් වාදනය කිරීම ................. නමින් හැඳින්වේ.

**42.** කවිකාර මඩුවෙහි සේවය කළ කර්ණාටක සංගීතඥයින් වන අලගනායිදු, නාරසිංහ සහ .................... යන තිදෙනා අතුරෙන් අලගනායිදු විසින් .............................. නම් වූ නාඩගම නිර්මාණය කරන ලද බව සඳහන් වේ.

**43.** සිංහල ගීතයක් කණ්ඩායම් සංගීතය සඳහා ප්‍රථම වරට යොදාගත් සංගීත කණ්ඩායමේ නම ...................... වන අතර එම කණ්ඩායමේ නායකයා ................................................. නම් වේ.

**44.** නාඩගමක චරිත දෙකක් අතර යෙදෙන සංවාදාත්මක ගී පද කොටස......................... නමින් හැඳින්වේ. ඒ සඳහා උදාහරණයක් ලෙස ................................ නාඩගමෙහි ගැයෙන 'යානත අතුල මල්පෙති' ගීතය සඳහන් කළ හැකි ය.

**45.** ඇමෙරිකානු ජාතික ................................ නම් මනෝවිද්‍යාඥයා විසින් හඳුන්වා දුන් 'බහුවිධ බුද්ධිය' සිද්ධාන්තය අනුව ස්වර ස්ථාන පිළිබඳ අවබෝධය ඇති වීමට ................................ බුද්ධිය හේතු වේ.

**46.** | ස ග ප | ධ ම රි | නි̣ ප රි | ස - - | ස්වර ප්‍රස්තාරයට අදාළ කෝඩ්ස් (Chords) පිළිවෙළින් විභාග හතර මත යෙදෙනුයේ ................. ලෙස වන අතර, ඉන් පිළිබිඹු වන හින්දුස්ථානි තාලය .................... නම් වේ.

**47.** 'මධ්‍ය සඩ්ජ' ස්වරයේ සංඛ්‍යාතය හර්ට්ස් 256 වන්නේ නම් ඊට අදාළ ව 'මධ්‍ය ගාන්ධාරයේ' සංඛ්‍යාතය හර්ට්ස් ................. ලෙස ද, මධ්‍ය පංචමයේ සංඛ්‍යාතය හර්ට්ස් .................. ලෙස ද වේ.

**48.** සංගීත චිකිත්සාව සඳහා ඉන්දියානු ශාස්ත්‍රීය සංගීතයෙහි .................... හා බැඳි නාදමාලාවන්ද, මෙරට දේශීය සංගීතයෙහි නැලවිලි ගීත සහ ...................... ගීතයන්හි එන නාදමාලාවන් ද යොදාගෙන ඇත.

**49.** දේශීය චිත්‍රපට කලාවේ සන්ධිස්ථානයක් වන රේඛාව චිත්‍රපටයේ ස්වතන්ත්‍ර තනු නිර්මාණය ...................... විසින් ද ගීත ප්‍රබන්ධය.......................................... විසින් ද සිදු කරන ලදී.

**50.** පිළිගත් සංගීත පද්ධති ලෙස සලකනු ලබනුයේ පෙරදිග, අපරදිග, ..........., ඉස්ලාමික් සහ ........... නම් වූ සංගීත පද්ධතීන් ය.

* * *

Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

පැරණි නිර්දේශය/பழைய பாடத்திட்டம்/Old Syllabus

OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உ யர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

පෙරදිග සංගීතය II
கீழைத்தேய சங்கீதம் II
Oriental Music II

54 S II

2019.08.08 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

✳ **I** කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, **II** කොටසින් **එක්** ප්‍රශ්නයකට ද, **III** කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, වශයෙන් ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න. (සෑම ප්‍රශ්නයකට ම **ලකුණු 20** බැගින් ලැබේ.)

## I කොටස

**1.** පහත දී ඇත්තේ නිර්දේශිත රාග හතරකට අයත් ස්වර සංගති කොටස් කිහිපයකි.

**A** - රිමප නිස් නිනිප
**B** - ගමප නිස් නිනිප
**C** - රිමප නිස් නිධප
**D** - ගමප නිස් නිධප

(i) ඉහත රාග හතර හඳුනාගෙන අදාළ ඉංග්‍රීසි අක්ෂර ද සමග පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 08 යි.)

(ii) ඉහත රාග අතුරෙන් 'රිෂභය' සහ 'පංචමය' පිළිවෙළින් වාදී සහ සංවාදී ලෙස යෙදෙන රාග **දෙකක්** නම් කර, ඉන් **එක්** රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල් ගීතයක හෝ වාදිතයක හෝ ස්ථායි කොටස තාල සංකේත සහිතව ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 07 යි.)

(iii) 'දීප්චන්දි' තාලයේ ඨේකාව සමගුණයෙන් තාල සංකේත සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 03 යි.)

(iv) ඉහත **B** හි සඳහන් ස්වර සංගති කොටස, දීප්චන්දි තාලයේ එක් ආවර්තයකට ගළපා ප්‍රස්තාර කරන්න. (ලකුණු 02 යි.)

**2.** නිර්දේශිත රාග හා සම්බන්ධ කරුණු කිහිපයක් පහත **A, B, C** යටතේ දක්වා ඇත.

**A** - 'මධ්‍යම' ස්වරය වාදී ලෙස ද 'සඩ්ජ' ස්වරය සංවාදී ලෙස ද යෙදේ.
**B** - රාගයට නියමිත ආරෝහණයේ ස්වර යෙදීමේ පිළිවෙළ අනුව 'පංචම' ස්වරය වර්ජ්‍ය වේ.
**C** - රාගයට නියමිත අවරෝහණයේ 'රිෂභ' ස්වරය යෙදේ.

(i) **A** හා **B** හි කරුණු **දෙකට ම අදාළ වන** නිර්දේශිත රාග **දෙකක්** නම් කර, ඉන් **එක්** රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල් ගීතයක හෝ වාදිතයක හෝ ස්ථායි කොටස තාල සංකේත සහිතව ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 07 යි.)

(ii) **A** හා **C** හි කරුණු **දෙකට ම අදාළ වන** නිර්දේශිත රාග **දෙකක්** නම් කර, එම රාග දෙක අතර අසමානතා **හතරක්** උදාහරණ සහිතව පෙළගස්වන්න. (ලකුණු 06 යි.)

(iii) **A, B** හා **C** හි කරුණු **තුනට ම අදාළ වන** රාගය නම් කර, එම රාගයට අයත් රාග සංගති **දෙකක්** සහ මාත්‍රා 16 කට නොඅඩු තානාලංකාරයක් ලියන්න. (ලකුණු 04 යි.)

(iv) මාත්‍රා දහයකින් යුත් නිර්දේශිත තාලයක ඨේකාව සමගුණයෙන් තාල සංකේත සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 03 යි.)

[දෙවැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

**3.** පහත දැක්වෙනුයේ සමප්‍රකෘති රාග තුනකට අදාළ වගුවකි.

| රාගය | මේලය | ජාතිය | වාදී - සංවාදී | විකෘති ස්වර |
|---|---|---|---|---|
| .........A......... | ආසාවරී | ෂාඩව - සම්පූර්ණ | .....G..... | ග ධ නි |
| .....B..... | .....D..... | .....E..... | රි - ප | නැත |
| .....C..... | භෛරව | .....F..... | ප - ස | .....H..... |

(i) ඉහත වගුවෙහි A සිට H තෙක් ඇති හිස්තැන් සඳහා ගැළපෙන පිළිතුරු අදාළ ඉංග්‍රීසි අක්ෂරයද සමග පිළිතුරු පත්‍රයේ ලියන්න. (ලකුණු 08 යි.)

(ii) වගුවෙහි තොරතුරු අනුව හඳුනාගත් රාග අතුරෙන් **එක්** රාගයකට අදාළව රාගාශ්‍රිත ස්වර රචනාවක්, ත්‍රිතාලයේ ආවර්ත **දෙකක්** සම්පූර්ණ වන ලෙස නිර්මාණය කර, ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

(iii) A, B, C සඳහා ගැළපෙන රාග අතුරෙන් **එක්** රාගයක ගානසමය නම් කර, එම ගානසමය තීරණය කිරීමට හේතු වුන කරුණු **දෙකක්** උදාහරණ සහිතව ලියන්න. (ලකුණු 03 යි.)

(iv) ඉහත වගුවෙහි විස්තර අනුව හඳුනාගත හැකි රාග දෙකකට අදාළ සමප්‍රකෘති රාග **දෙකක්** නම් කර, ඉන් **එක්** සමප්‍රකෘති රාග යුගලයක **අසමානතා දෙකක්** ලියන්න. (ලකුණු 03 යි.)

(v) A, B, C සඳහා ගැළපෙන රාග අතුරෙන් වක්‍ර ස්වර යෙදෙන රාගය නම් කර, අවරෝහණයෙහි යෙදෙන වක්‍ර ස්වරය ලියන්න. (ලකුණු 02 යි.)

## II කොටස

**4.** පහත A සහ B හි දැක්වෙන්නේ වන්නම් **දෙකකට** අයත් කරුණු ය.

A - තානම, කවිය, කලාසම, අඩව්ව

B - තානම, කවිය, කස්තිරම, සීරුමාරුව, අඩව්ව


(i) A සහ B හි සඳහන් කරුණු සම්බන්ධ වන්නම් සම්ප්‍රදායන් **දෙක** වෙන් වෙන්ව නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) එම එක් එක් වන්නම් සම්ප්‍රදායෙහි විශේෂ ලක්ෂණ **දෙක** බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි.)

(iii) 'ප්‍රශස්ති ගී' පිළිබඳ පහත සඳහන් කරුණු ඇසුරෙන් විස්තරයක් කරන්න.
- ආරම්භය හා ව්‍යාප්තිය
- සංගීත ආභාසය
- භාවිත කළ සංගීත භාණ්ඩ
- ඉන්දියානු සංගීතඥයෝ (ලකුණු 08 යි.)

(iv) ප්‍රශස්ති ගී හා හටන් ගීවල සමානතා **තුනක්** සහ අසමානතා **තුනක්** ලියා දක්වන්න. (ලකුණු 06 යි.)

**5.** පහත සඳහන් වගුවෙහි **A, B, C** සහ **D** මගින් දැක්වෙන්නේ, ශ්‍රී ලංකාවේ රංග සම්ප්‍රදායන් හතරකට අයත් වන තාල වාද්‍ය භාණ්ඩ හතරකි.




(i) ඉහත වගුවෙහි ඇතුළත් වාද්‍ය භාණ්ඩ ප්‍රධාන වශයෙන් යොදා ගන්නා රංග සම්ප්‍රදායන් හතර හඳුනාගෙන අදාළ අක්ෂර සමග නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) **A** අක්ෂරයට අයත් රංග සම්ප්‍රදායෙහි සුවිශේෂී ලක්ෂණ **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)

(iii) **B** හා **D** අක්ෂරවලට අයත් රංග සම්ප්‍රදායන් දෙකෙහි සංගීතමය ලක්ෂණ **හතරක්** සංසන්දනාත්මකව ලියන්න. (ලකුණු 04 යි.)

(iv) **C** අක්ෂරයට අයත් රංග සම්ප්‍රදාය පිළිබඳ ව පහත කරුණු යටතේ විස්තරයක් ලියන්න.
- සංගීතමය ලක්ෂණ සහ රංග ශෛලිය
- රඟ දක්වන ස්ථාන, චරිත සහ රංග උපකරණ (ලකුණු 08 යි.)

[තුන්වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

## III කොටස

6. 



(i) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරයේ දැක්වෙන ටයිම් සිග්නේචරයට (Time signature) ගැළපෙන දේශීය තිත නම් කරන්න. (ලකුණු 02 යි.)

(ii) දී ඇති ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි.)

(iii) පෙරදිග ක්‍රමයට ලියූ එම ස්වර ප්‍රස්තාරය මධ්‍යම භාවයෙන් නැවත ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි.)

(iv) පහත සඳහන් මාතෘකා අතුරෙන් **දෙකක්** තෝරාගෙන නිදසුන් දක්වමින් විස්තර කරන්න.

(a) කවුන්ටර් පොයින්ට් (Counter point) (b) කෝඩ්ස් (Chords)

(c) ඇඩ්ලිබ් (Adlib) (d) හාර්මනි (Harmony) (ලකුණු 03 × 2 = 06 යි.)

7. (i) පහත දැක්වෙන ගී පාද, ගැළපෙන තාලයකට අනුව පද ප්‍රස්තාර කරන්න.
"සියලු ජාතීන් සමග එක් වී - දැයයි සමයයි රකිනු පණ මෙන්" (ලකුණු 04 යි.)

(ii) ඉහත ගී පද ප්‍රස්තාරය සඳහා නිර්දේශිත ඕනෑම රාගයකින් සුදුසු තනුවක් නිර්මාණය කර, ගීත ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 08 යි.)

(iii) එම තනුවට ගැළපෙන කෝඩ්ස් (Chords) යොදන්න. (ලකුණු 04 යි.)

(iv) ඔබ නිර්මාණය කළ තනුවට ගැළපෙන පෙරවාදනයක් (Introduction) ප්‍රස්තාර කර, තනුවට ගැළපෙන හින්දුස්ථානි තාලය ද ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

8. (i) පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **දෙකක්** තෝරාගෙන උදාහරණ සහිතව කෙටියෙන් විස්තර කරන්න.

(a) රෝග සුවපත් කිරීමෙහි ලා සංගීතයේ සුවිශේෂී බව

(b) සංගීතමය බුද්ධිය

(c) ශ්‍රී ලංකාවේ චිත්‍රපට ඉතිහාසයේ මුල් යුගයේ දකුණු ඉන්දීය ආභාසය

(d) මිනිස් කටහඬෙහි ගුණාත්මක බව ඇති කිරීමට බලපාන ජීව විද්‍යාත්මක සාධක

(ලකුණු 04 × 2 = 08 යි.)

(ii) ඛ්‍යාල් හෝ ගසල් හෝ **එක්** ගායන ශෛලියක් පිළිබඳ, පහත සඳහන් කරුණු යටතේ විස්තර කරන්න.

- සංගීත භාණ්ඩ
- ගායන ශිල්පීන්
- සංගීතමය ලක්ෂණ
- භාෂා මාධ්‍යය (ලකුණු 04 යි.)

(iii) රාගාශ්‍රිත සරල ගීයක් පිළිබඳ පහත කරුණු යටතේ ඇගයීමක් කරන්න.

- ආශ්‍රිත රාගයේ නාදමය ලක්ෂණ
- රාගධාරී ශාස්ත්‍රීය අංග
- ගායනයේ සුවිශේෂී බව
- හඬ පාලනය (ලකුණු 04 යි.)

(iv) (a) සිතාර්, සරෝද්, එස්රාජ් සහ වයලින් යන එක් එක් සංගීත භාණ්ඩ වාදනයට සුප්‍රසිද්ධ ඉන්දියානු ශිල්පියකු බැගින් නම් කරන්න. (ලකුණු 02 යි.)

(b) ඉන් **එක්** සංගීත භාණ්ඩයක් පිළිබඳ සුවිශේෂී කරුණු **හතරක්** ලියන්න. (ලකුණු 02 යි.)

* * *

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka